# ශ්‍රී ලංකා 1 :50,000 භූ ලක්ෂණ සිතියම් කියවීම

## භූගෝල විද්‍යාව

## 09 ශ්‍රේණිය

## 5 පාඩම

M.රමිශා මාහර

කෑ /දෙහි / මියනවිට කණිෂ්ඨ විද්‍යාලය

දැරණියගල

- භූමියේ ස්වභාවිකව නිර්මාණය වූ ලක්ෂණ ද මිනිසාගේ මැදිහත්වීමෙන් නිර්මාණය වූ ලක්ෂණ ද මෙමඟින් නිරූපණය කෙරේ.
- මෙම ලක්ෂණ නිරූපණයට වර්ණ, අක්ෂර ,සංකේත හා අංක භාවිතා කර ඇත.
- පොළෝතලයේ විවිධ ලක්ෂණ මෙම සිතියම් මඟින් ඉදිරිපත් කළ හැකිය.



# භූ ලක්ෂණ සිතියම්

- කිසියම් ප්‍රදේශයක භූ දර්ශනය අධ්‍යනයට භූ ලක්ෂණ සිතියම් ඉතා වැදගත් වේ.

## භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ලක්ෂණ

### භෞතික ලක්ෂණ

- ජලවහනය
- වෙරළ ලක්ෂණ
- ස්වභාවික වෘක්ෂලතා
- භූ විෂමතා ලක්ෂණ


### සංස්කෘතික ලක්ෂණ


ජනාවාස

ප්‍රවාහන මාර්ග

භෝග වගාවන්

# භූමිය මත දකින ස්වභාවික ලක්ෂණ








# මිනිසාගේ මැදිහත් වීමෙන් නිර්මාණය කරන ලද ලක්ෂණ








ටෝකියෝ අසල අධිවේගී මාර්ග පද්ධතියේ හුවමාරුවක් (Highway Interchange)




නිවාස සංකීර්ණයක්



# භූ ලක්ෂණ සිතියම් කොටසක්.



ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ දැක්වීමට 1 :50,000 පරිමාණයෙන් සිතියම් පත්‍ර 92 කට බෙදා ඇත.



# 1. භෞතික ලක්ෂණ

- තැනිතලා
- උස් බිම්
- ගංගා නිම්නය
- ප්‍රධාන ගංගාව
- අතු ගංගාව
- දූපත
- තුඩුව
- මුහුදු බොක්ක




## 1.තැනිතලාව

- සමෝච්ච රේඛා දෙකක් අතර පරතරය විශාල වීම / සමෝච්ච රේඛා කිහිපයකට පමණක් සීමා වීම මඟින් තැනිතලා බිමක් හඳුනාගත හැකිය.
- මෙම ප්‍රදේශවල තැනින් තැන දක්වා ඇති ස්ථානීය උස / තැන් උස ආධාරයෙන් තැනින් තැන වෙනස්වන උස දැන ගත හැකිය.






# 3. උස් බිම


- ප්‍රදේශයක ඇති උසින් වැඩි බිමක් උස් බිමක් වේ.
- සමෝච්ච රේඛා බහුලව මෙන්ම ආසන්නව ද විහිදී ඇත.
- කඳු , සානු , නේරු වැනි ලක්ෂණ දැකගත හැකිය.






## 3. ගංගා නිම්නය

- උස් බිම දෙසට සමෝච්ච රේඛා විහිදී තිබීමෙන් නිම්නය හඳුනා ගත හැකිය.
- ප්‍රධාන ගංගා හා අතු ගංගා එම නිම්න ඔස්සේ ගලා බසියි.










## 4. ප්‍රධාන ගංගාව

- කඳුකර ප්‍රදේශයකින් පටන් ගෙන කිසියම් ප්‍රදේශයක් හරහා සාගරයකට හෝ විලකට ගලා බසින විශාල ජල ධාරාව ප්‍රධාන ගංගාව ලෙස හැඳින්වේ.

## 5.අතු ගංගා

- ප්‍රධාන ගංගාවට ජලය සපයන කුඩා දිය දහරා අතු ගංගා වේ.



# 6 . දූපත්

- සෑම දිශාවකින්ම ජලයෙන් වට වූ ගොඩබිමයි.
- ඩෙල්ෆ් , කයිට්ස් , නාගදීපය ,











9.2 සිතියම - වෙරළ ලක්ෂණ

# 7 .බොකු

- පුළුල් විවරයකින් සාගරය හා සම්බන්ධ වී ඇති ගොඩබිමට කාවැදුණු මුහුදු කොටසයි.

- කොඩ්ඩියාර් / වැලිගම / ආරුගම් බොක්ක






# 8 . තුඩු

- වෙරළ තීරයේ සාගරය දෙසට නෙරා ගිය පටු ගොඩබිම් කොටස වේ.
- දෙවුන්දර තුඩුව / පේදුරු තුඩුව / සංගමන්කන්ද තුඩුව






# සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම

- මිනිසා විසින් භූමිය පරිහරණය කර ඇති ආකාරය සහ එහි නිර්මාණය වී ඇති ලක්ෂණ සංස්කෘතික ලක්ෂණ ලෙස හැඳින්විය හැකිය.

- භූමිය මත නිර්මාණය වී ඇති මිනිස් කටයුතුවල ව්‍යාප්තිය විවිධ සංකේත හා වර්ණ මඟින් හඳුනාගත හැකිය.






ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි

7.9 රූපය

1:50 000 භූ ලක්ෂණ සිතියමක සම්මත සලකුණු දක්වන සටහන

# මායිම් වර්ග

- 1 : 50,000 භූ ලක්ෂණ සිතියම්වල සියලුම පරිපාලන මායිම් රතු වර්ණයෙන් හා විවිධ සංකේතවලින් දක්වා ඇත.
- මෙම මායිම් සිතියමේ දක්නට ලැබුණ ද භූමිය තුළ විද්‍යමාන නොවේ.
- පරිපාලන මායිම් වෙන් කරන සීමා බොහෝ දුරට ගංගා ,කඳුවැටි වැනි භෞතික ලක්ෂණ පදනම් කරගෙන ඇත.


මාර්ග - අධිවේගී මාර්ග







# මාර්ග

- මංමාවත් /දුම්රිය මාර්ග යන ශීර්ෂ යටතේ සංකේත මඟින් ඉදිරිපත් කර ඇත.










Scale : 1 : 50 000


# විශේෂ ගොඩනැගිලි

- ✓ ස්ථිර ගොඩනැගිලි - කුඩා කළු කොටුවකින්
- ✓ විශේෂ ගොඩනැගිලි - තරමක් විශාල කොටුවකින් / නම ද ලියා ඇත.
- ✓ ඉදිකරන බිම් - ලා රතු පැහැයෙන්
- ✓ පොදු සේවා සපයන මධ්‍යස්ථාන , ආගමික සිද්ස්ථාන



# වගා බිම්


- ගෙවතු වගා - කහ පැහැය
- වී වගාව - කොළ පැහැය
- තේ /රබර් /පොල් - කහ පැහැය මත කොළ පැහැ සංකේත




# භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතාවය

## 1. භූ විෂමතාවය - මාර්ග රටාව

- තැනිතලා ප්‍රදේශයක සෘජු මාර්ග රටාවක් හඳුනාගත හැකිය.
- කඳුකර ප්‍රදේශවල වංගු සහිත මාර්ග රටාවක් හඳුනාගත හැකිය. බොහෝ විට ගංගා නිම්න ආශ්‍රිතව විහි දී ඇත.



1:50,000




9.3 සිතියම - භූ ලක්ෂණ සිතියමක ඇතුළත් වන සංස්කෘතික ලක්ෂණ

# 2 භූ විෂමතාවය - කෘෂි භෝග ව්‍යාප්තිය


- පහත් තැනිතලා ප්‍රදේශවල , ගංගා නිම්න ආශ්‍රිතව - පුළුල්ව විහිදුණ වී වගාව
- කඳුකර ප්‍රදේශවල ගංගා නිම්න ආශ්‍රිතව පටු දිගටි වී වගාව / හෙල්මළු වී වගාව
- තේ වගාව
- මධ්‍යම උසකින් යුතු කඳු බෑවුම්වල - රබර් වගාව
- වෙරළබඩ ප්‍රදේශවල පොල් වගාව
- වියළි කලාපීය ප්‍රදේශවල - ලඳු කැලෑ / හේන්වගාව

වෙරළබඩ ප්‍රදේශ




1:50,000

කඳුකර ප්‍රදේශ



## 3 භූ විෂමතාවය - ජනාවාස ව්‍යාප්තිය

- තැනිතලා ප්‍රදේශවල - පුළුල්ව පැතිරුණු ජනාවාස
- මාර්ග හා පටු බිම් තීරු දිගේ - රේඛීය ජනාවාස
- මංසන්ධි - පොකුරු ජනාවාස
- කඳුකර ප්‍රදේශවල - විසිරුණු ජනාවාස
- මිනිසාගේ ජීවන රටාව අනුව ද
  - වැව් ආශ්‍රිත- වැව් ගම්මාන
  - වෙරළාශ්‍රිත - ධීවර ගම්මාන
  - වතු ආශ්‍රිතව - වතු ගම්මාන


- මීට අමතරව ග්‍රාමීය ජනාවාස / නාගරික ජනාවාස ලෙස ද වෙන් වී තිබේ.
- උප තැපැල් කාර්යාල , අප්‍රධාන මාර්ග ,කරත්ත පාර , අඩිපාර යනාදිය මඟින් ග්‍රාමීය ජනාවාස හඳුනාගත හැකිය.

- නගරයක රෝහල් , ප්‍රධාන තැපැල් කාර්යාල ,උසාවි ,පොලීසි දක්නට ලැබේ.
- ප්‍රධාන මාර්ග ගණනාවක් ඒකරාශී වී ඇත.
- සමහර ස්ථානවල දුම්රිය මාර්ග ද දක්නට ලැබේ.
- මෙවැනි ප්‍රදේශ ඉදිකළ ප්‍රදේශ ලෙස රෝස පාට වර්ණයෙන් දක්වා තිබේ.

ඉදිකළ ප්‍රදේශ




වැව් ගම්මාන



## ග්‍රාමීය ප්‍රදේශයක ජනාවාස




## කඳුකර ප්‍රදේශයක ජනාවාස

